**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2016**

**------------------------------------------------------------**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 468.9 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවා තිබූ රු. 46,257,776 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු. 32,859,055 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිට නිරවුල් කර තිබුණද අදාළ නිරවුල් කිරීම ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් අත්තිකාරම් ගිණුම සහ කෙරීගෙන යන වැඩ ගිණුම එම වටිනාකමෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ලෙස රු. 5,718,147 ක් දක්වා තිබුණද බැංකු ශේෂ සනාථ කිරීම් අනුව එය රු.6,706,120 ක් වූයෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු. 987,973 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් විෂයයන් 5 කට අදාලව දක්වා තිබූ ශේෂයන් ඊට අදාළ උපලේඛන සමග සැසඳීමේදී එකතුව රු.5,941,349 ක වෙනසක් විය.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | --------------- | ------------ | -------------------------- |
| | | රු. | |
| (අ) | අවසාන තොගය | 11,483,637 | භෞතික තොග සත්‍යාපන වාර්තා |
| (ආ) | ක්‍රීඩා සංගම් වලින් ලැබිය යුතු ශේෂ | 10,172,936 | ශේෂ සනාථන ලිපි |
| (ඇ) | ලැබිය යුතු ශේෂ | 33,536,437 | |
| | | 55,193,010 | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂවල එකතුව රු. 43,709,373 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වලින් රු.28,246,743 ක් වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වී තිබුනද අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ආ) වර්ෂ තුනක කාලයක් ගත වී තිබූ එකතුව රු. 437,878 ක් වූ ගෙවිය යුතු ශේෂ 11 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 හා 2013 වර්ෂ සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වෙනුවෙන් රු.8,939,262 ක් වෙන්කර තිබුණද එම බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට හෝ ගිණුම්වල නිරවුල් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

--------------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ---------------------------------------- | ----------------- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03කට පෙර අයවැය ලේඛනය පිළියෙල කර එය අධිකාරියේ පාලක මණ්ඩලය විසින් අනුමත කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දීමට හැකි වුවද අවස්ථා 7කදී එකතුව රු. 2,388,905 ක් වූ අත්තිකාරම් මුදල් නඩත්තු අංශයේ සහ මිලදී ගැනීම් අංශයේ විෂය ලිපිකරුවන් වෙත ලබා දී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.117,402,554 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.246,797,596 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.129,395,042 කින් හෙවත් සියයට 52 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපෙක්ෂව රාජ්‍ය ප්‍රදාන රු. 29,050,000 කින් හෙවත් සියයට 22 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් සිදු වි තිබුණි. එහෙත් 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී ඌනතාවය වර්ධනය වී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපිමේදී 2012 වර්ෂයේදී රු.90,592,946 ක් වූ අධිකාරියේ දායකත්වය 2015 වර්ෂයේ හැර අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.150,745,273 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ජංගම අනුපාතය 1.22 සිට 2.19 දක්වාද ක්ෂණික අනුපාතය 1.13 සිට 2.08 දක්වාද වර්ධනය වී තිබූ අතර ඒ අනුව ආයතනයේ කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව ඉහළ ගොස් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

අධිකාරිය ස්ථාපිත කරන ලද 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත අනුව ආයතනයේ අරමුණු මොනවාද යන්න නිශ්චිතව දක්වා නොමැති වුවද, ආයතනයේ කර්තව්‍යයන් ලෙස ජවන හා පිටිය තරඟ, පිහිනුම් තරඟ පැවැත්වීමට හා පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සැපයීම, විභාග සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීමට සහ මහජන රසාස්වාදය වෙනුවෙන් ශ්‍රවණාගාර ශාලා පහසුකම් සැපයීම, ක්‍රීඩකයන් සඳහා නේවාසික පහසුකම් සැපයීම සහ එම කාර්යයන් සඳහා පැමිණෙන අයගේ රථවාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම දක්වා තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විශේෂ මූල්‍ය ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේදී මීටර් 400 හා මීටර් 200 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 99 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 හා 2012 වර්ෂවලදී අධිකාරිය විසින් රු.24,919,800 ක් රාජ්‍ය බැංකුවක සත්දින නිවේදන තැන්පතු යටතේ ආයෝජනය කර තිබූ අතර 2016 වර්ෂයේ මුල් මාස හතර සහ අවසාන මාස 08 සඳහා පිළිවෙලින් සියයට 4.5 ක් හා සියයට 5.75 ක පොලී ප්‍රතිශතයක් ලැබී තිබුණි. මෙම සත්දින නිවේදන තැන්පතු සඳහා 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 6,706,120 ක පොලී මුදලක් ලැබී තිබූ අතර බැංකුව විසින් මෙම පොලිය සඳහාද සත්දින නිවේදන තැන්පතු වලට අදාළ පොලී ගෙවා තිබුණි. ඉහත ආයෝජන මුදල් දිගුකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළේ නම් ඉහළ පොලී ආදායමක් ලබා ගැනීමට හැකියාව තිබුණද සත්දින නිවේදන තැන්පතුවල ආයෝජනය කිරීම හේතුවෙන් අධිකාරියට මූල්‍යමය වශයෙන් වාසිදායක තත්ත්වයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් සඳහා දුරබැහැර ප්‍රදේශවල සිට පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නවාතැන් පහසුකම් සපයා දීමේ අරමුණින් සුගතදාස ක්‍රීඩා හෝටලය ඉදිකර තිබුණද මුදල් අයකිරීමකින් තොරව අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් ලබා දී තිබුණි. එසේම ක්‍රීඩා හෝටලය තුළ ස්ථාපිත කර ඇති ආරක්ෂිත කැමරා පද්ධතිය වර්ෂයක කාලයක සිට අක්‍රීයව පැවතුණි.

(ඇ) විශ්‍රාම වැටුප් පාරිතෝෂික වෙන් කිරීම් රු. 2,770,919 ක් දීර්ඝ කාලීනව ආයෝජනය කිරීම වෙනුවට ලංකා බැංකු ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි.

**4.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 135 ක් වූ ප්‍රධාන ක්‍රීඩාගාරයේ වහළය හා ලී පොළවෙහි අලුත්වැඩියා කටයුතුවලට අදාළ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 03 දින ප්‍රදානය කර තිබූ අතර 2016 නොවැම්බර් 30 දින එම අලුත්වැඩියා කටයුතු අවසන් කිරීමට ඉලක්ක කර තිබුණි. එසේ වුවද, ඇස්තමේන්තුවේ දෝෂ සහගත තත්ත්වයන් මත 2016 නොවැම්බර් 30 වන විටද ලී පොළවේ අලුත්වැඩියා කටයුතු ඉටු කර නොතිබුණි.

(ආ) සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ජල නිවාරණ කටයුතු සහ බිම් ගඩොල් ඇතිරීම සඳහා රු.මිලියන 29.45 ක කොන්ත්‍රාත්තුවක් 2016 පෙබරවාරි 02 දින පිරිනමා තිබූ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට එම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව තිබුණ ද 2016 දෙසැම්බර් 31 දින වන විටද එම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරිය විසින් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 15 දිනය.

**5.2** **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් කර අධිකාරිය විසින් සකස් කළ බව දැක්වෙන ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**5.3** **අයවැය පාලනය**

-------------------

වැය විෂයයන් 13 ක ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 28 සිට සියයට 121 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) ණයගැති හා ණයහිමි පාලනය | (i) උපරිම ණයගැති සීමාව හා කාලය සම්බන්ධයෙන් සීමා නිර්ණය නොකිරීම. |
| | (ii) ණයගැතියන්ගේ ශේෂ සනාථන ලබා නොගැනීම. |
| | (iii) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම. |
| (ඇ) ගිණුම්කරණය | (i) ගිණුම්කරණය සඳහා මිලදී ගත් මෘදුකාංගය මගින් සම්පූර්ණ ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක නොකිරීම. |
| | (ii) වගකිව යුතු නිලධාරියෙකුගේ අනුමැතියක් සහිතව ජ'නල් සටහන් නොයෙදීම. |
| (ඈ) අයවැය පාලනය | අයවැය සහ සත්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් පැවතීම. |